Page 10 October 2009.qxd 20/10/2009 07:40 Page 1



# කඳවුරු වලින් විසිදාහක් පැනගිහින් රැඳවියන් පන්නා කෝටි 200ක් උපයලා ජාවාරමට දේශපාලකයෙක් හවුල්

උතුරේ අවතැන් කඳවුරු වලින් සරණාගත රැඳවියන් 20,000 ක් පැනගොස් ඇති බවත් හොර රහසේ ඔවුන් කඳවුරෙන් පිටමං කිරීමේ කාර්‍යයට ශ්‍රීලංකාවේ ප්‍රබල දේශපාලකයෙකුද හවුල්ව ඇති බවත් ආරංචි මාර්ග අනාවරණය කරයි.

මෙම දේශපාලනඥයාගේ සොහොයුරා අවතැන් කඳවුරුවලින් රැඳවියන් පිටකිරීම ජාවාරමක් හැටියට කරගෙනයන බවත් ඉන් ඔහු දැනට රුපියල් කෝටි 200 කට වඩා මුදලක් උපයාගෙන ඇති බවත් සොයාගෙන ඇත. රැඳවියෙකු පිට කිරීමට රුපියල් ලක්ෂයේ සිට ලක්ෂ 5 දක්වා මුදලක් අය කරන බවත් මෙම ජාවාරම කරගෙන යෑම සඳහා ඔහු මුදල් ගෙවා ඇතුළත හා පිටත තරව්කාරයින් පිරිසක් එකතුකරගෙන සිටින බවත් කියති.

අදාල මුදල දුන් පසු තරව්කරුවන් හරහා අවශ්‍ය රැඳවියන් කඳවුරෙන් පිටතට ගෙන වව්නියාවට හෝ කොළඹට ඔවුන් විසින් ම ප්‍රවාහනය කරනු ලබති. අවතැන් කඳවුරු ඉන්නා කොටි සාමාජිකයන් පිටරට කොටිසංවිධාන වලින් මුදල් ගෙන්වාගෙන පැන යන බවත් සොයාගෙන ඇත.

රිවිර පුවත්පතින් කළ විමසුමක දී නැවත පදිංචි කරවීමේ අමාත්‍ය රිෂාර්ඩ් බදුර්දීන් මහතා පවසා ඇත්තේ ඒ සියළු චෝදනා ඔහු ප්‍රතික්ෂෙප කරන බවත් එසේ කිසිවෙකුට පැනයන්නට ඉඩක් නැති බවත්ය. එහෙත් උතුරේ කඳවුරු වලින් අවතැන්වූවන් 20,000 කට වඩා පැනගොස් ඇති බවත් ඒ පිළිබඳව සොයා බැලීමට දකුණෙන් පොලිස් භටයින් විශාල පිරිසක් උතුරට යවා ඇති බවත් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී රන්ජිත් කස්තුරි ආරච්චි මහතා මහනුවරදී පැවති දිස්ත්‍රික් සම්බන්ධීකරණ රැස්වීමේ දී පවසා ඇත.



උතුරේ යුද්ධය අවසන් වූ දිනවල කොටින්ගෙන් මිදී ද්‍රවිඩ ජනයා හමුදාව වෙත පැමිණ බාරවූයේ මෙසේය.

# ඇතුවත් බැරී නැතුවත් බැරී මොබයිල් (2)

ගියවර ලිපියෙන් අපි මොබයිල් දුරකතනයේ උපත සහ එය ජන සන්නිවේදනයේ පැමිණ ඇති දුර හා විවිධ පුද්ගලයන්ගේ එයට ඇති ප්‍රතිචාරය ගැන ද කතා කළෙමු. මේවර මොබයිලය ගැන වෙනත් අයුරක තොරතුරු ය.





අද වෙළඳ පොලෙහි ඇති ජංගම දුරකතන තාක්ෂණය අතින් කොතරම් දියුණු තත්වයක පවතීද යත් කෙනෙකුගේ සාක්කුවේ ශබ්දකෝෂයක්, පරිගණක යන්ත්‍රයක්, විශ්වකෝෂයක්, කැමරාවක්, විඩියෝ යන්ත්‍රයක්, ගුවන් විදුලි යන්ත්‍රයක් හා රූපවාහිනියක් යන මේ සියල්ලම එක ගුලියට තිබෙනවා වැනි ය. එපමණක් නොව වාහනයක් එළවාගෙන යනවා නම් එම මොබයිලය ඕනෑම නොදන්නා පාරක්ද සොයාගෙන, ඕනෑම දුර පළාතක ඒ අවශ්‍ය තැනට නිවැරදිව ඔබ කැඳවාගෙන යනවා ද ඇත.

පසුගිය කාලයේ ශ්‍රීලංකාවේ කොටි ත්‍රස්තවාදය දරුණු අන්දමින් පවතිද්දී කොටි නායකයින් යුද්ධය මෙහෙයවූයේ හා අපරාධ කළේ තනිකරම මොබයිල් මගින් පණිවුඩ හුවමාරු කර ගැන්මෙන් බව කවුරුත් දනිති. කොටි නායකයා තමාගෙන් පසු නායකකමට **KP** නමැති අය පත් කළේ මොබයිල් පණිවුඩයක් දීමෙන් බව දැනගන්නට ඇත. නමුත් වැඩි දිනක් ගත වන්නට මත්තෙන් **KP** අත්අඩංගුවට ගනු ලැබුවේත් ප්‍රභාකරන්ගේ මොබයිල් පෝනයේ වූ කේපීගේ මොබයිල් අංකය සොයා ගැනීමත් ඒ මගින්ම ඔහු සිටිනා තැන හරියටම දැනගන්නට රහස් පොලිසියට හැකිවූ නිසාත් ය.

වයස අවුරුදු 10 ටත් 19 ටත් අතර බාල පරපුරෙන් 99% ක්ම මොබයිල් පෝන් භාවිතා කරන බව සමීක්ෂණ සංඛ්‍යා ලේඛන පෙන්වා දෙයි. මොබයිල් භාවිතය ජනප්‍රියවීමට කලින් දෙමාපියෝ ළමයින්ද බලන නිසා රූපවාහිනියේ අවේලාවල් වල අඩනිරුවත් ජවනිකා පෙන්වීම ගැන ඉමහත් අපහසුතාවට පත්ව සිටියෝය. පසුව පරිගණක යන්ත්‍ර රූපවාහිනය අභිබවා එක ළමයාට එක බැගින් ගෙදරට ගෙනා විට අන්තර් ජාලය මගින් ළමයින් මොන කුණුහරුප බලනවාදැයි කියා සොයාබැලීමට අපහසු තත්වයකට දෙමාපියෝ පත් වූහ. මොබයිල් පෝන් දැන් බාලවයස්කාරයින් අතරට ලැබුණාට පසු ඉහතකී තත්වය තවත් නරක අතට හැරී ඇති බැව් දෙමාපියන් නොදන්නවා විය හැකිය.

ළමයෙකුට මොබයිලයක් අරන් දෙන්නේ හදිසියකට ගෙදරට කතාකරන්නට හෝ දෙමාපියන්ට හදිසියේ දරුවා අමතන්නට අවශ්‍යවුවහොත් පහසුවනු පිණිසය. එහෙත් මොබයිල් දුරකතනයේ ඕනෑම රූපයක් යැවීමට හා ගෙන්වාගැනීමට ද පහසුකම් ඇති බැවින් දැන් බොහෝවිට මොබයිලය යොදාගෙන ඇත්තේ වෙනත් කටයුත්තක් සඳහාය. එනම් නිරුවත් ඡායාරූප හා ලිංගික දර්ශණ ඇතුළත් කෙටි විඩියෝ පට හුවමාරුකර ගැන්මටය. ඒවාට වයස් සීමාවක් නැති බැවින් ළමයින්ගේ ටෙලිපෝන්වලට ද ඒවා බොහෝවිට ඇතුළත්කර ඇති බව බොහෝ දෙමාපියෝ නොදන්නවා ඇත.

මෑතකදී ශ්‍රීලංකාවේ පාසැල් බාලිකාවක් මෙවැනි දෙයක් හේතු කොටගෙන පාසැලේ වැසිකිළියේ එල්ලී මැරුණු සිද්ධියක් අසන්නට ලැබිණ. මෙය කියවන ඔබගේ බාල දරුවන්ට මොබයිල් පෝන් ලබා දී ඇත්නම් ඒවායේ අඩංගු රූපරාමු මොනවාදැයි පරීක්ෂාකර බලන්න.

මොබයිල් පෝන් පාවිච්චියේ ඊළඟ දුක්ඛදායක පැත්ත නම් එය හේතුකොට ගෙන බෙල්ලේ, ඔළුවේ හා මොළයේ පිළිකා හටගැන්මේ අන්තරාවයි. වෛද්‍ය පරීක්ෂණ වලින් ඔප්පු වුණේ ජංගම දුරකතනය ක්‍රියාත්මක වීමේදී ඉන් නිකුත්වන කිරණ ශරීරයට අතිශය හානිදායක බවයි. ජනතාව බියවැදී මොබයිල් පෝන් භාවිතය අත්හරීයයි සිතූ නිශ්පාදකවරු විශාල මුදල් කන්දරාවක් වැයකර එසේ හානදායක බවක් දැනගන්නට නැතැයි යනුවෙන් තවත් වෛද්‍යවරුන් කණ්ඩායක් ලවා කියැවූහ. දැන් යළිත් පිළිකා කතාව ඇවිස්සී ඇවිත් තිබේ. මේ නිසාම ප්‍රංශ රජය අවුරුදු 12 ට පහළ ළමයින් අතර මොබයිල් භාවිතය තහනම් කරන්නට යන බවක් පසුගියදා අසන්නට ලැබිණ.



මේ සියල්ල මෙසේ වෙද්දී මොබයිල් පෝනය මඳ වශයෙන් භාවිතාකරන අය සිටිති. එය ඉතා නුවණට හුරු වැඩක් බව කිව හැකිය. ජංගම දුරකථනය හානිකර නම් එම හානිය අවම කරගත හැක්කේ එය හැකි තරම් අඩුවෙන් පාවිච්චි කිරීමෙනි.

ගිය වසරේ මුළු ලෝකයේ මොබයිල් පෝන් මිලියන 950 ක් විකිණී ඇති බව සැබෑ සංඛ්‍යාලේඛන පෙන්වා දෙයි. ඒ අනුව තව වසර 10 ක් ඇතුළත මුළු විශ්වය පුරා ලොකු කුඩා සෑම කෙනෙකු අතම මොබයිලයක් රැඳෙනු ඇතැයි දැනටම ගණන් සාදා ඇත. පිළිකා උවදුර ගැන සිතා බැලුවහොත් අනාගතයේදී ලෝක ජනගහනයෙන් වැඩි කොටසක් පිළිකා වැළඳී මියයාම සිදුවනු ඇතැයි සිතට බියක් ද දැනේ.

♦ විල්ප්‍රඩ් පෙරේරා Berks UK



# සරණාගත කොටි වල්ගය



උතුරෙ මුලතිව් කිලිනොච්චි හා නැගණහිර ගම්මානවලින් කොටින්ගෙන් බේරිලා රජයේ පාලන ප්‍රදේශ වලට ඇවිත්, ශ්‍රීලංකා හමුදා රැකවරණයට පත්වෙලා, කඳවුරු ගතවුණු දෙමළ ජනයා ලක්ෂ තුනකට වැඩි ප්‍රමාණයක් ඉන්න බව ගිය මැයි මාසෙ යුද්ධය ඉවරවුණු ගමන් රජයෙන් දැනුම් දුන්නා. මාස දෙකක් ඇතුළත හිටපු ගමන් වැළ නොකැඩී ආපු මේ සෙනගට කන්න බොන්න දෙන්න, වෛද්‍ය පහසුකම් දෙන්න, ආරක්ෂාව දෙන්න, රජයට කියන්න බැරිතරම් විසාල මුදලක් වියදම් වෙනවා. ඒත් රජය දත කාගෙන, මුළු ලෝකෙන්ම බැනුම් අහ අහා, කරබාගෙන හිතට අරගෙන තමන්ගෙ පවුලෙ දෙයක් වගේ අනාථ නාථ ක්‍රියාවලියෙ යෙදෙනවා. ඒක හොඳ ගුණයක්. මේ ආත්මේදි ම නිවන්න දකින්නත් බැරි නෑ.

හුහාක් වෙලාවට කාල ඉවර වෙලා, කන්න දීපු මිනිස්සුන්ට බැනබැන යනවා. කොටි හමුදාවෙන් තමන්ගෙත් පවුලෙ ඉලන්දාරි දරුවන්ගෙත් පණ බේරලා දුන්නට මුලින් පින් දීපු මිනිස්සුම, දැන් ආණ්ඩුවට පස්පඩංගුවේ බනිනවා, අපිව මෙතන කොටු කරන් ඉන්නෙ, අපිට යන්න දීපල්ලකො කියලා. අනාත කඳවුරු අටවන කොටම අපි දැනන් හිටියා ඔහොම අහන්න වෙන බව. කොහොමත් උතුරෙ ජනයගෙන් කළගුණ සැලකීමක් කවදාවත් බලාපොරොත්තුවෙන්න බෑ. උන් සිංහළ මිනිස්සුන්ට හැමදාම බනිනවා ගරහනව මිසක හොඳක් කියලා නෑ. අර ගුත්තිල කාව්‍යයෙ කියන විදියට, වතුරෙ පාවෙලා යන දර කොටේකට උදව් කළා හා සමානයි. මේ අනාත කඳවුරු වැඩේ කෙලින්ම කොටි වලිගයක් වග අපි දැනගෙන හිටියා.

කොටි වලිගෙ කතාව මේකයි. කොටිය අල්ලලා, උගෙ වල්ගෙන් අල්ලගෙන ඇදගෙන ඉන්නකොට ඌ පස්සට හැරෙන්නෙ නෑ. ඉස්සරහට ඇදෙනවා පැනලා යන්න හිතාගෙන. අල්ලන් ඉන්න කෙනාට දිගටම කොටියගෙ වල්ගෙ ඇදලා අල්ලන් ඉන්න බෑ, අත රිදෙනවා. අතහරින්නත් බෑ, අතඇරියොත් කොටිය පස්සට හැරිලා පැනලා කනවා. අතඇරලත් බෑ. අල්ලන් ඉන්නත් බෑ. මේ සරණාගත කඳවුරු ප්‍රශ්නෙත් අන්න ඒ වගේ. සරණාගතයො තියාගෙනත් බෑ. දැන්ම යන්න දීලත් බෑ.

දැන්ම යන්න දෙන්න බැරි මෙතන බාගෙකටත් වැඩිය ඉන්නෙ කොටි ත්‍රස්තවාදී සාමාජිකයො. එළියෙයි පිටරට තැන්වලයි ඉන්න ඩයස්පෝරා කොටියො කඳවුරට පණිවුඩ එවනවා, “යකෝ! බොලා ඔතනට වෙලා කකා බිබී ඉන්නෙ නැතුව කොහොම හරි පැනලා පලයව්! ගිහිං අර වළලා තියන ආයුධයි, බෝම්බයි ගොඩට අරගෙන මුන්ට ගහපියව්. මේ සැරේ ගහපියව් මුන් සමතලා වෙන්න. අපි මෙහෙන් තව බඩු එවන්නම්! ”

මේ මනස්ගාත වෙන අතරෙ ඒ කඳවුරුවලින් 20,000ක් පැනලා ගිහිං කියලා ආණ්ඩුවෙ ප්‍රධාන නිලධාරීන් කියනවා. අච්චර තද ආරක්ෂක වළල්ලක් යොදලා තියන තැන්වලින් දෙතුන් දෙනෙක් නෙවෙයි මාස දෙකක් ඇතුළත විසිදාහක් පැනලා ගියා කියන්නෙ සම්පූර්ණයෙන්ම කඳවුරුවල ගේට්ටු ඇරලා දාලද තියෙන්නෙ? තවම රජය ඒක කොහොමද වුණේ, කවුද වගකිව යුත්තෙ කියලා සොයලා නැහැ. ඒක මහ ලැජ්ජාවක්. අනාථ කඳවුරේ ලොකු බිස්නස් එකක් ගිහිං තියනවා. තවමත් යනවා මං හිතන්නෙ. ඒක නවතින්නෙ නෑ.

ලංකාවෙ සිද්ධ වෙන හුහක් දූෂණ වලට කොහොම හරි, කවුරු හරි දේශපාලකයෙක් ගෑවෙනව. මේ කඳවුරුවලින් රැඳවියන් පැන්නීමටත් දේශපාලකයෙකුගෙ සහෝදරයෙක් සම්බන්ධ බව කියනවා. සිංහළයින් අතරේ දූෂිතයො ඉන්න තාක් කල් තව ඊළම් යුද්ධ එකක් නෙවෙයි, සීයක් වුනත් පටන් ගන්න පුළුවන් බව කොටි දන්නවා. ඒ වගේම ඒ නිසාම යම් දවසක ඊළම පිහිටවන්න පුළුවන් වේය කියලා උන් විස්වාස කරනවා.

තවමත් උතුරෙ කොටි හංගපු ආයුධ හම්බ වෙනවා. විසිදාහක් පැනලා ගියානම් එතන දහ දාහක්වත් තද කොටි ඇති. උන්ට අවශ්‍ය ආයිත් ලංකාව පුරා පිපිරවීම් පටන්ගන්න. කොළඹ සහ සිංහළ පළාත්වල කොටි හංගපු ක්ලේමෝ බෝම්බ තියනවා. ආණ්ඩුව ප්‍රීති උත්සව පවත්වනවා. ජයග්‍රහණය ගැන උදම් වෙනවා. දකුණේ ඡන්දෙ දිනන එක ගැන උනන්දු වෙනවා. ඒ අතරෙ කොටි ආයි වැඩ පටන් ගන්න නැකැත් බලනවා.

විසිදාහක් පැනලා ගියානම් ඉතුරු ටික අල්ලන් ඉන්න එකේ තේරුමක් නෑ. දැන් රජයට කරන්න තියෙන්නෙ ඔය කොටිවලිගෙ අතඅරින්න. කඳවුරුවල ගේට්ටු සේරම ඇරලා දාලා, හැමෝටම මෙහෙම කියන්න: “ උඹලගෙ හොඳටයි මේ හැම දෙයක්ම අපි කළේ.....උඹලට යන්න ඕන නම් පලයල්ලා..... හැබැයි එකෙක් වත් අඩාගෙන ආයිත් මෙහේ එන්න එපා!

♦ වෙලේගෙදර රාළ London